කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය
(I කොටස)

10 වන ශ්‍රේණිය

පැය 01 යි
**One hour**


* පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
* පිළිතුරු ලකුණු කිරීම සඳහා ඔබට සැපයෙන පත්‍රිකාවේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ කතිර (X) ලකුණ යොදන්න.

(01) ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා වඩාත් ප්‍රබල ඓතිහාසික මූලාශ්‍ර ලෙස ඔබ තෝරා ගනු ලබන්නේ
(1) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා විදේශීය වාර්තා
(2) සාහිත්‍ය මූලාශ්‍ර හා කාසි
(3) සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
(4) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා වංශකතා

(02) විජය කුමරු ඇතුළු 700ක් පිරිස ලංකාවට පැමිණි දිනයේදී සිදුවූ සුවිශේෂ සිද්ධිය ලෙස සැලකෙන්නේ
(1) බුදුන් වහන්සේ පිරිනිවන් පෑම | (2) සිදුහත් කුමාරයාගේ උප්පත්තිය
(3) බෝධිසත්වයන් බුද්ධත්වයට පත් වීම | (4) මිහිඳු හිමියන්ගේ ලංකා ගමනය

(03) පළමුවන පරාක්‍රමබාහු හා දෙවැනි ගජබාහු අතර ඇති කරගත් ඓතිහාසික සමගි සම්මුතිය දැක්වෙන සෙල්ලිපිය කුමක් ද?
(1) ගල්පොත ශිලා ලිපිය | (2) දෙවන ගල ශිලා ලිපිය
(3) සංගමු විහාර ශිලා ලිපිය | (4) ගල් විහාර සෙල්ලිපිය

* පහත දී ඇති ලංකා සිතියම ඇසුරෙන් අංක 4 - 8 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(04) ශ්‍රී ලංකාවේ බිහි වූ මුල් ආර්ය ජනාවාසය දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(05) සිතියමේ කදම්බ නදී සහ ගෝන නදී පිළිවෙළින් දක්වා ඇති අංක දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) 1 සහ 3 (2) 2 සහ 4 (3) 5 සහ 6 (4) 1 සහ 4

(06) පළමු විජයබාහු රජු සේනාසංවිධානය කළ මහානාගහුල නම් ස්ථානය පිහිටා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(1) Q (2) R (3) P (4) S

(07) ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ රාජධානියක ට අංක 8 යොදා ඇත. එම රාජධානිය වන්නේ,

(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) දඹදෙණිය (4) ගම්පොළ

(08) සිතියමේ සේයා කර ඇත්තේ මහසෙන් රජතුමාගේ අනුග්‍රහයෙන් ඉදි කරන ලද වාරි කර්මාන්තයකි. එය

(1) හුරුළු වැව
(2) මින්නේරිය වැව
(3) මහකනදරා වැව
(4) කවුඩුලු වැව

(09) ක්ලෝඩියස් රජුගේ සමයේ රෝමයට ගිය දූත පිරිසක් ලංකාවට පැමිණෙන විට රතු පබුලු තොගයක් ගෙන ආ බවත්, ඒවායින් රුවන්වැලි සෑය සැරසූ බවත් මහාවංශයේ සඳහන් වේ. එම සිද්ධිය වනවිට ශ්‍රී ලංකාව පාලනය කළ රජතුමා තෝරන්න.

(1) I සේන රජු
(2) දුටුගැමුණු රජ
(3) භාතිකාභය රජු
(4) සද්ධාතිස්ස රජ

(10) "අ" තීරයේ දැක්වෙන සිද්ධීන් හා "ආ" තීරයේ රජවරුන් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" තීරය | | "ආ" තීරය | |
|---|---|---|---|
| (1) | සේන සහ ගුත්තික අශ්ව වෙළෙඳුන් දෙදෙනාගේ ආක්‍රමණය | A | දුටුගැමුණු රජතුමා |
| (2) | භල්ලුකගේ ප්‍රධානත්වයෙන් පැමිණි හමුදාව සමඟ සටන් කිරීම. | B | වළගම්බා රජතුමා |
| (3) | රුහුණේ නකුල ග්‍රාමයේ තිය හෙවත් තිස්ස බමුණාගේ කැරැල්ලට මුහුණ දීම. | C | අසේල රජතුමා |
| (4) | මේඝවර්ණාභය ඇමතිවරයා කැරැල්ලට නායකත්වය දීම. | D | සූරතිස්ස රජතුමා |
| | | E | මහසෙන් රජතුමා |

(1) ABCE
(2) DBEA
(3) BEDC
(4) DABE

(11) අවුකන පිළිමය මඟින් බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක් පිළිඹිබු වේද?

(1) තාදී ගුණය
(2) දසබලධාරී ගුණය
(3) කරුණා ගුණය
(4) මෛත්‍රී ගුණය

(12) අනුරාධපුර යුගයේ දී ඉන්දියානු සංක්‍රමණිකයන් හා ආක්‍රමණිකයන් ශ්‍රී ලංකාවට ගොඩබැසීම සඳහා බහුලව භාවිතා කර ඇති වරාය කුමක්ද?

(1) මහාතිත්ථ
(2) උරුවෙල
(3) ගෝකණ්ණ
(4) දඹකොළ පටුන

(13) ලම්බකර්ණ රජ පෙළපතේ ආරම්භක පාලකයා වූයේ පහත සඳහන් කවරෙක්ද?

| | | | |
|---|---|---|---|
| (1) | වසභ රජතුමා | (2) | මහසෙන් රජතුමා |
| (3) | වලගම්බා රජතුමා | (4) | ධාතුසේන රජතුමා |

(14) ධම්මපදට්ඨ කථාවේ ගැඹුරු වදන් සිංහලයෙන් විවරණය කරන ලද "දම්පිය අටුවා ගැටපදය" රචනා කළා යැයි සැලකෙන රජතුමා වන්නේ,

| | | | |
|---|---|---|---|
| (1) | පළවන අග්බෝ රජු | (2) | දෙවන පරාක්‍රමබාහු රජු |
| (3) | IV පරාක්‍රමබාහු රජු | (4) | පස්වන කාශ්‍යප රජු |

(15) ධාතුසේන, වසභ, මහසෙන් යන රජවරුන්ගේ කාර්යයන් සම්බන්ධයෙන් පොදු ලක්ෂණය කුමක්ද?

(1) ලංකාව සතුරන්ගෙන් මුදවා ගැනීම සඳහා කටයුතු කිරීම.
(2) වාරි කර්මාන්තය දියුණු කිරීමට විශාල සේවයක් කිරීම.
(3) විදේශ රටවලින් භික්ෂූන් වහන්සේලා ගෙන්වා උපසම්පදාව යලි පිහිටු වීම.
(4) අභ්‍යන්තර වියවුල් ගහණ කාලයක් වීම.

(16) අතීතයේ රජවරුන් වාරිමාර්ග තැනීමේදී භූගෝලීය පිහිටීම මෙන්ම ජලය උරා ගැනීම ඇළවේලි ශක්තිමත්ව පවත්වා ගැනීම පිළිබඳව සැලකිල්ලක් දක්වා ඇත. මෙයින් වඩාත්ම ගම්‍ය වන අදහස ලෙස සැලකිය හැක්කේ,

(1) භූමියේ පිහිටීම අධ්‍යයනය කොට වැව් සෑදූ බව ය.
(2) එදා රජවරු භූ විෂමතාවය මෙන්ම වාරි තාක්ෂණය පිළිබඳවද අවධානය යොමු කළ බවය.
(3) වැව් සෑදීම හා ඇළවේලි සෑදීම රජවරුන්ගේ කාර්යයක් වූ බවයි.
(4) ගොවිතැන් කටයුතු සඳහා වාරි කර්මාන්ත පහසුකම් සලසා ඇති බවයි.

(17) ජාතක කතා පොත සිංහලයට පරිවර්තනය කරන ලද්දේ පහත කුමන රාජධානි සමයේද?

| | | | |
|---|---|---|---|
| (1) | ගම්පොළ | (2) | කෝට්ටේ |
| (3) | කුරුණෑගල | (4) | මහනුවර |

(18) පහත සඳහන් සිදුවීම් අතුරෙන් වළගම්බා රාජ්‍ය සමයේදී මෙරට පැමිණි විදේශිකයකුට අසන්නට ලැබෙන සිදුවීම් දෙක තෝරන්න.

A - චන්ද්‍රභානුගේ ආක්‍රමණය
B - ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩ පැවැත්වීමට අම්බුලුගල කුමරු යැවීම.
C - ක්ෂත්‍රිය අභිෂේක උත්සව ක්‍රමයක ආරම්භය ඇතිවීම.
D - එළාර රජු සමඟ සටන් කර රට එක්සේසත් කිරීම.

| | | | |
|---|---|---|---|
| (1) | B සහ C | (2) | C සහ D |
| (3) | A සහ C | (4) | B සහ D |

(19) රජරට ප්‍රදේශයේ ජීවත් වූ ජනතාව රාජධානි වෙනස් වීමත් සමඟම ආර්ථික රටාවේද වෙනස්කම් රාශියක් ඇතිවිය. ඒ අනුව කුරුණෑගල විස්තරය නම් පුස්කොළ පොතෙන් හෙළිවන ප්‍රධාන කරුණ වන්නේ,

(1) විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතීම.
(2) ඉන්දියාවෙන් කසී සළු ආනයනය කර ඇත.
(3) අභ්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ වූ මාර්ග පද්ධතියක් තිබූ බව
(4) අභ්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ කඩවීදි තිබුණු බව

(20) ලංකාවේ ථෙරවාදී බුද්ධදහම ආරක්ෂා කර ගැනීමට එදා රජවරු අනුග්‍රහ දැක්වූ බව පෙන්වීමට හොඳම උදාහරණය තෝරන්න.

(1) ගෝඨාභය රජතුමා වෛතුල්‍යවාදී භික්ෂූන් 60 නමක් දිවයිනෙන් පිටුවහල් කිරීම.
(2) සංඝමිත්‍රා භික්ෂුවගේ පෙළඹවීම මත මහසෙන් රජතුමා මහා විහාරයට එරෙහි වීම.
(3) කුපික්කල තිස්ස තෙරුන් වහන්සේ තවත් භික්ෂූන් 500 ක් සමඟ අභයගිරි විහාරයේ පදිංචියට යෑම.
(4) මහානාම රාජ්‍ය සමයේ දී අට්ඨකථා පාලියට පරිවර්තනය කිරීම.

(21) ඉන්දියාව ජනාවාස වීමේදී මධ්‍යම ආසියාවේ සිට හින්දුකුෂ් කඳුවැටිය හරහා කපොලු ඔස්සේ ආර්යයන් ඉන්දියාවට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ. ඔවුන් ඉන්දියාවට පැමිණියේ කවර දුර්ග මාර්ගය ඔස්සේ ද?

(1) මක්‍රාන්ය.
(2) බෝලාන්ය.
(3) ඛයිබර්ය.
(4) බැරෝඩාය.

(22) ක්‍රි.පූ. 6වන සියවස වන විට උතුරු ඉන්දියාවේ ජනපද 16ක් ව්‍යාප්තව පැවතුණි. ඉන් මගධ රාජධානියේ අගනුවර වූයේ,

(1) කුසිනාරා නුවර
(2) විශාලා මහ නුවර
(3) කිඹුල්වත් නුවර
(4) රජගහ නුවර

(23) ග්‍රීක ජාතික මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා පංජාබය ඇතුළු වයඹ දිග ඉන්දියාව ආක්‍රමණය කළද ගංගා යමුනා තැනිතලාව ආක්‍රමණය කළ නොහැකි වූයේ කුමන රාජවංශයක් යටතේද?

(1) ගුප්ත රාජවංශය.
(2) මෞර්ය රාජවංශය.
(3) නන්ද රාජවංශය
(4) චන්ද්‍රගුප්ත මෞර්ය රාජවංශය

(24) ඉන්දියාවෙන් පිටත ප්‍රදේශ වලට ගුප්ත අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත කළ ගුප්ත පාලකයා ලෙස සැලකෙන්නේ කවරෙක්ද?

(1) කුමාර ගුප්ත රජු
(2) දෙවන චන්ද්‍රගුප්ත රජු
(3) සමුද්‍ර ගුප්ත රජු
(4) ස්කන්ධ ගුප්ත රජු

(25) මහා පරාක්‍රමබාහු රජු, මහා විජයබාහු වැනි රජවරුන් අග්නිදිග ආසියාව සමඟ සබඳතා පැවැත් වූ බවට සාක්ෂි ඇත. ඒ අනුව මහා විජයබාහු රජතුමා උපසම්පදාව සඳහා භික්ෂූන් වහන්සේලා වැඩම කරවූ අග්නිදිග ආසියාතික රට තෝරන්න.

(1) බුරුමය
(2) ජාවා දූපත්
(3) සියමය
(4) සුමාත්‍රා දූපත්

(26) ඉස්ලාම් ආගමේ කුරානය පමණක් පිළිගත් පිරිස අයත් වූ නිකාය හඳුන්වන්නේ කෙසේද?

(1) සුන්නි
(2) ෂියා
(3) කලීෆා
(4) ජෙසියා

(27) දකුණු ඉන්දියාවේ මුස්ලිම් බලය රැඳී තිබුණේ මේ රාජ්‍ය හේතුවෙනි. එම රාජ්‍යය වන්නේ,

(1) විජයනගර් රාජ්‍යය
(2) බහමනී රාජ්‍ය
(3) ගුජරාටය
(4) බෙංගාලය

(28) දේශ ගවේෂණ කටයුතු සඳහා මුලින්ම අවධානය යොමුකළ යුරෝපීය රටවල් දෙක තෝරන්න.

(1) ප්‍රංශය සහ එංගලන්තය
(2) ඕලන්දය සහ ඉතාලිය
(3) පෘතුගාලය සහ එංගලන්තය
(4) පෘතුගාලය සහ ස්පාඤ්ඤය

(29) පුනරුදසමයේ විද්‍යාත්මක ක්ෂෙත්‍රයේ නව සොයා ගැනීම් "අ" තිරුවේද ඒ හා සම්බන්ධ පුද්ගලයින් "ආ" තීරුවේ ද දැක්වේ. "අ" තීරුව හා "ආ" තීරුව ගැළපූ විට නිවැරදි අක්ෂර අනුපිළිවෙල දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?

| "අ" තීරය | | "ආ" තීරය | |
|---|---|---|---|
| (i) | දුරදක්නය නිපදවීම | A | නිකලස් කොපර්නිකස් |
| (ii) | පෘථිවිය ගෝලාකාර බවත් අනෙක් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බව | B | ජොහැන්නස් ගුටන්බර්ග් |
| (iii) | මුද්‍රණ යන්ත්‍රය නිපදවීම | C | පැරසල්සස් |
| (iv) | ලෙඩරෝග සෑදීමට හේතුද ඒවාට ප්‍රතිකර්ම සොයා ගැනීම. | D | ගැලිලියෝ ගැලීලි |
| | | E | විලියම් හාවේ |

(1) B, E, C, A
(2) D, A, B, C
(3) D, A, C, B
(4) A, C, D, E

(30) යුරෝපීය පුනරුදය යටතේ දේශ ගවේෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් නොවන්නේ පහත කුමක්ද?
(1) රටවල් ඈඳා ගැනීම හා යටත් විජිත බිහිවීම.
(2) වෙළෙඳාමේ දියුණුව
(3) කාර්මික විප්ලවය කරා යොමු වීම.
(4) ශුද්ධ රෝමයේ අධිරාජ්‍යයේ බලය දුර්වල වීම.

(31) රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ සිවිලි මේ චිත්‍ර නිර්මාණය කරන ලද්දේ,
(1) ලියනාඩෝ ඩාවින්චි විසිනි
(2) මයිකල් ආන්ජලෝ විසිනි
(3) රෆායල් විසිනි
(4) මැසෙක්සියෝ විසිනි

(32) වැඩවසම් ක්‍රමයේ නයිට්වරුන් සතු රාජකාරිය ලෙස සැලකුයේ,
(1) ප්‍රවේණිදාසයන් ලවා ඉඩම්වල වගා කරවීමය.
(2) අධිකරණ කටයුතු වලට රජුට සහාය දීමය.
(3) රජුට පමණක් දෙවැනි කටයුතු කිරීමය.
(4) රජුට අවශ්‍ය අවස්ථා වලදී හමුදාව සපයා දීමය.

(33) පුනරුද සමයේදී කතෝලික පල්ලියේ බලයට විරුද්ධව නැගී ආ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට නායකත්වය දුරූ පුද්ගලයෙක් නොවන්නේ,
(1) මාර්ටින් ලූතර්
(2) ස්විංගල්
(3) ජෝන් කැල්වින්
(4) වයික්ලිෆ්

(34) ඉන්දියාවේ අග්‍රාහි පිහිටි ටජ්මහල් මන්දිරය තනවන ලද්දේ,
(1) මහා අක්බාර් රජුය.
(2) සාජහාන්.
(3) ජහන්ගීර් රජුය.
(4) ස්මයිල්මුබ රජුය.

(35) මෝගල් අධිරාජ්‍යය ඉන්දියාවේ ස්ථාපිත වීමට බලපෑ ප්‍රධානම හේතුව ලෙස සඳහන් කළ හැකි වන්නේ,
(1) ලෝදි රාජවංශය තුළ තිබූ අසමගිය.
(2) ලෝදි රාජවංශයේ බලලොල් ලෝදි ගේ දුර්වල පාලනයයි.
(3) ටුග්ලුග් රාජවංශයේ අසමගිය.
(4) ලෝදි රාජවංශයේ අවසාන කාලයේ කාන්තා නායකත්වයක් ගැනීමය.

(36) කුරුස යුද්ධය මාලාවක් ඉතිහාසය පුරා යුරෝපය තුළ සිදු වී ඇත. කුරුස යුද්ධය යනු,
(1) ක්‍රිස්තියානි භක්තිකයන් හා යුදෙව් ආගමිකයන් අතර යුද්ධයයි.
(2) ක්‍රිස්තියානි භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයේ අතර යුද්ධයයි
(3) ක්‍රිස්තියානි භක්තිකයන් හා බෞද්ධයන් අතර පැවති යුද්ධයයි.
(4) යුදෙව් ආගමිකයන් හා හින්දු ආගමිකයන් අතර යුද්ධයයි.

(37) පුනරුද සමයේ කලා ක්ෂේත්‍රයේ චිත්‍ර කලාවට සුවිශේෂී ස්ථානයක් හිමි වූ නගරය.
(1) ජිනෝවා නගරයයි.
(2) ෆ්ලෝරන්ස් නගරයයි.
(3) රෝමයයි.
(4) කොන්ස්තන්තිනෝපලයයි.

(38) ක්‍රි. ව. 1600 පමණ වන විට ඉන්දියාවේ විශාල ප්‍රදේශයක මෝගල් අධිරාජ්‍ය පැතිරී තිබුණි. එකල රජකළ මෝගල් පාලකයා වූයේ,
(1) මහා අක්බාර් රජුය.
(2) සාජාහාන් රජුය.
(3) ජහන්ගීර් රජුය.
(4) හුමායුන් රජුය.

(39) මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය වශයෙන් භාවිතා වූයේ,
(1) රෝම ගෘහනිර්මාණ ශිල්පය
(2) ප්‍රංශ ගෘහනිර්මාණ ශිල්පය
(3) ගොතික් ගෘහ නිර්මාණ ශිල්පය
(4) ඉතාලි ගෘහ නිර්මාණ ශිල්පය

(40) ඉතාලි ජාතික බොකෑෂියෝ, ඩාන්ටේ, පෙට්රාක් කුමන ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වැදගත් වීද?
(1) පුනරුද සමයේ විද්‍යා ක්ෂේත්‍රය
(2) මධ්‍යගත යුගයේ වැඩවසම් ක්‍රමය
(3) පුනරුද සමයේ කලාව
(4) පුනරුදය සමයේ මානවවාදය

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය
(II කොටස )

10 වන ශ්‍රේණිය

පැය 03 යි
Three hour's

නම/ විභාග අංකය ....................................................

- පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න 03 කට ද තුන්වන කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06කි.

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලංකා සිතියමෙහිද, (ii) කොටසේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලට සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) හුරුළු වැව, යෝධ ඇළ, කප්පරකන්ද නදී, මහනුවර, මහාතිත්ථ, යාපනය, පාහියන්ගල, මහානාගහුල, කැළණිය, දිගාමඩුල්ල (ලකුණු 10)

(ii) කොන්ස්තන්තිනෝපලය, ලිස්බන්, හොවැංහෝ ගඟ, කැලිකට්, රතුමුහුද, මලක්කා සමුද්‍ර සන්ධිය, බ්‍රිතාන්‍ය, රෝමය. (ලකුණු 08)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.


A - පෘතුග්‍රීසින් ශ්‍රී ලංකාවට පැමිණෙන විට උඩරට රජතුමා ලෙස කටයුතු කෙළේ කවුරුන් ද?

B - විදාගම ශ්‍රී සනානන්ද පිරිවෙන ඉදිකරවා චෝළ දේශයෙන් වැඩම කළ මහා සංඝයාට පූජාකළ රජතුමා නම් කරන්න.

C - ඉන්දියාවේ සෝම්නාත් දේවාලය විනාශ කර මහා ධනයක් රැස්කරගත් පාලකයා කවුරුන්ද

D - අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා නම් කරන්න.


(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති කලා නිර්මාණ හඳුනාගෙන ඒවා පිළිවෙලින් නම් කරන්න.




A



B



C



D

(ලකුණු 04)

(iii) පහත සඳහන් A,B,C,D ප්‍රකාශන හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද පිළිවෙලින් යොදන්න.

A - ලංකාවේ අවුරුදු 2500 ට වඩා පැරණි අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ගොඩ නගා ගැනීමට මහාවංශය උපකාරී වෙයි. (_____)

B - පදවි වැව හා නාච්චදූව වැව පලමුවන අග්බෝ රජතුමාගේ නිර්මාණයන්ය. (_____)

C - මහා අක්බාර් රජතුමා මෝගල් රාජ වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා විය. (_____)

D - වයික්ලිෆ් විසින් බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළේය. (_____)

(ලකුණු 04)

### (II කොටස )

(02) (i) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ශ්‍රී ලංකාවේ ජනාවාසව පැවැති ස්ථාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ප්‍රථම ආර්ය සංක්‍රමණික කණ්ඩායම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ආර්යයන් මෙරට පිහිටුවාගත් මුල්ම ආර්ය ජනාවාස වල පාලනය සිදුකල ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහාවිජයබාහු රජතුමා චෝළයන් එළවා දමා රට එක්සේසත් කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර විස්තර කරන්න.

(ලකුණු 06)

(03) (i) ගම්පොළ රාජධානිය සෙසු රාජධානිවලට වඩා ආරක්ෂිත ජනාවාසයකට වඩාත් සුදුසු වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) කෝට්ටේ රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු වූ 6 වන පරාක්‍රමබාහු රජතුමාගෙන් ඉටු වූ සේවාවන් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) රජරට ප්‍රදේශයේ ජීවත් වූ ජනතාවගේ රාජධානි වෙනස්වීමත් සමගම ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙද සැලකෙන්නේ ඇයි දැයි නිදසුන් තුනක්වත් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පොළොන්නරු රාජධානියේ රජකළ වැදගත් රජවරුන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D වලින් දැක්වෙන එක් එක් කාර්යය හා සම්බන්ධ රජවරුන් කවුරුන් දැයි සඳහන් කරන්න.

A - සේන හා ගුත්තික අශ්ව වෙළෙඳුන් ගෙන්, රට බේරාගත් රජතුමා

B - ප්‍රථම වරට ලම්භකර්ණ පෙළපතට රාජ්‍ය බලය ලබාගත් රජතුමා

C - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධියෙන් පිදුම් ලද රජතුමා


D - කන්තලේ හා ගිරිතලේ වැව් තැනවීම (ලකුණු 04)

(iii) වළගම්බා රාජ්‍ය සමය ආගමික වශයෙන් වැදගත් සිදුවීම් ගණනාවක් හටගත් කාලච්ඡේදයකි. නිදසුන් දෙකක් දක්වමින් පහදන්න. (ලකුණු 05)

(iv) මහා පරාක්‍රමබාහු රජතුමා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්ත දියුණුවට වැදගත් මෙහෙයක් ඉටු කළ පාලකයෝ බව විස්තර කරන්න. (ලකුණු 06)

(05) අතීතයේ මෙරට පැවති ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිපාලනය රටාවක්, වාරිමාර්ග තාක්ෂණයක් ඉතා උසස් මට්ටමක පැවතුණ බවට සාක්ෂි ඇත.

(i) පහත රූපසටහනේ වලින් දක්වා ඇති වැවක කොටස් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)



(ii) පහත දැක්වෙන ඒ ඒ කාර්යයන් සඳහා ගොඩනැගෙන ලද තාක්ෂණික නිර්මාණ මොනවාදැයි පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

A - බාහිර ජල සැපයුමක් මඟින් වැවකට ජලය සැපයීම.

B - වැවේ උපරිම ජල මට්ටම සලකුණු කරන වැව වටා ඇති ප්‍රදේශය.

C - ගලා යන ජල පහරක් හරස් කොට බැම්මක් බැඳීම.

D - වැවේ රැඳවූ ජලය කෙතබිම් කරා ගෙනයාම.

(පිටවාන. කළිඟුබැම්, ඇතුළුවාන. සොරොව්ව, තාවුල්ල. වැව්බැම්ම, බිසෝකොටුව, ඇළ මාර්ග)

(ලකුණු 04)

(iii) ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ගම් පාලනය සම්බන්ධ වැදගත් පුද්ගලයා කවුරුන් දැයි නම් කර ඔහුගේ ඉටුවන කාර්යයන් දෙකක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) අතීතයේ වාරි ශිල්පින් වාරි මාර්ග නිර්මාණයේදී යොදාගත් තාක්ෂණික දැනුම ඉතා උසස් මට්ටමක පැවති බවට නිදසුන් තුනක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) ශ්‍රී ලංකාවේ කලා ශිල්ප වල ව්‍යාප්තිය බුදු දහමේ ව්‍යාප්තියත් සමඟම සිදුවිය.

පහත බෞද්ධ චෛත්‍යයන් ඉදි කර වූ රජවරු A, B, C පිළිවෙලින් සඳහන් කරන්න.

A - රුවන්වැලි සෑය

B - ජේතවනාරාමය

C - අභයගිරිය

(ලකුණු 03)

(ii) ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ දී ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ පෙරදිග රටවල් දෙකක් සහ අපරදිග රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

(iii) අතීතයේදී ලංකාව සමඟ විදේශීය සම්බන්ධතා ඇතිවීමට මෙරට ස්ථානගත පිහිටීම බලපා ඇති බව සාධක දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) ක්‍රි. පූ. 6 වන සියවසේ සිට ක්‍රි. ව. 13 වන සියවස දක්වා පැවති ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පරිහානියට බල පෑ හේතු දෙකක් සඳහන් කර විස්තර කරන්න.

(ලකුණු 06)

(III කොටස )

(07) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ඉන්දියාව පිළිබඳ වැදගත් ඓතිහාසික සිදුවීම වන්නේ, ආර්යයන් ගේ පැමිණීමයි.

(i) ආර්ය සංක්‍රමණය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍ර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ක්‍රි. පූ. 6 වන සියවස වන විට උතුරු ඉන්දියාවේ පැවැති ප්‍රබල රාජාණ්ඩු හතර නම් කරන්න. (ලකුණු 04)

(iii) ආර්යයන් ක්‍රි. පූ. 6 වන සියවසේදී පමණ වන විට මුළු ඉන්දියාව තුළ ව්‍යාප්ත වූ ආකාරය කෙටියෙන් පහදා දෙන්න.

(ලකුණු 05)

(iv) ඉන්දියානු ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේදී අශෝක රජතුමා ශ්‍රේෂ්ඨ රජකෙනෙක් බව පෙන්වීමට නිදසුන් 3 ක් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 06)

(08) (i) පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

A - ඉස්ලාම් ධර්මයේ ආදි කර්තෘ කවු ද?

B - ඉස්ලාම් ඉගැන්වීම් ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

C - මූලින්ම ඉන්දියාවට මුස්ලිම් ආක්‍රමණයක් එල්ලවූ ප්‍රදේශය කුමක්ද?

(ලකුණු 03)

(ii) 13 වන සියවසෙන් පසු ඉන්දියාවේ දිල්ලිය මූල්කරගෙන බිහි වූ දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ ප්‍රධාන රාජවංශ හතරක් නම් කරන්න.

(ලකුණු 04)

(iii) මෝගල් රාජවංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා නම් කර, එතුමා සුවිශේෂී වීමට බලපෑ හේතු 2 ක් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධතා පැවැත් වූ අග්නිදිග ආසියාතික රටවල් තුනක් සඳහන් කර, එම සම්බන්ධතාවලට උදාහරණ තුනක්වත් දෙමින් පහදන්න.

(ලකුණු 06)

(09) (i) වැඩවසම් ක්‍රමය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

(ii) වැඩවසම් ක්‍රම තුළ දක්නට ලැබුණු පොදු ලක්ෂණ හතරක් ලියන්න.

(ලකුණු 04)

(iii) වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට හේතු වූ සාධක තුනක් සඳහන් කර ඉන් ඔබ කැමති කරුණු දෙකක් නිසා වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට දායක වූ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 03)

(iv) පුනරුද සමයේ ඇති වූ විද්‍යාත්මක ප්‍රබෝධයේ නවසොයා ගැනීම් උදාහරණ තුනක් වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

(10) (i) ක්‍රි. ව. 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීමත් සමඟ යුරෝපය තුළ ඇති වූ පුනරුද සමයේ පහත රටවල් සොයාගත් දේශ ගවේශකයන් A, B, C පිළිවෙලින් නම් කරන්න.

A - පිලිපිනය

B - කුණාටු තුඩුව

C - හිස්පැණියෝලාව (ලකුණු 03)

(ii) දේශ ගවේෂණයේ ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මානව වාදය යන්න හඳුන්වා මානව වාදය ව්‍යාප්ත වීමත් සමඟ භාෂා හා කලා ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුනු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කතෝලික පල්ලියේ බලයට විරුද්ධව නැගිසිටි කණ්ඩායම නම් කර, ඒ සඳහා මාර්ටින් ලූතර්ගෙන් සිදු වූ සේවය පැහැදිලි කරන්න. (ලකුණු 06)

ලොක්කා

දෙවන වාර පරීක්ෂණය

ඉතිහාසය

